(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(1).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 ජූලි 17 සිකුරාදා**

**2026 අගෝස්තු 04 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සහල් හිඟයක් මතුවූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවස්ථාවලදී සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සහල් ආනයනය කළ අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී ආනයනය කළ සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එලෙස ආනයනය කරන ලද සහල්, සතොස ආයතනය මඟින් වෙනත් පුද්ගලයන්ට හා වෙළෙන්දන්ට නීති විරෝධී ලෙස අලෙවි කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

136/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පසුගිය කාලයේදී විශාල සමාජ විරෝධයක් ඇතිවූ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1450/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ දිස්ත්‍රික් මට්ටමින් සේවය කරන 'සත්ත්වයින්ට එන්නත් කරන්නන්ගේ' සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාතට ඉහත තනතුර සඳහා අවශ්‍ය මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2018 වර්ෂයේදී ජලභීතිකා රෝගය මර්දනය කිරීමේ වැඩසටහන යටතේ 'ජලභීතිකා මර්දන සහායක' තනතුර සඳහා අනියම් පදනමින් බඳවා ගත් අය අතුරින්, 2019 වර්ෂයේදී 'සත්ත්වයින්ට එන්නත් කරන්නන්' ලෙස අනියම් පදනමින් බඳවා ගනු ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) එලෙස අනියම් පදනමින් බඳවා ගනු ලැබූ සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/2026

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(ii) 'රක්නා ආරක්ෂක ලංකා කුලුනු ව්‍යාපෘතිය' නමින් වාණිජ කාර්යාල සංකීර්ණයක් ඉදිකර තිබේද;

(iii) එසේ නම්, ආරම්භ කළ වර්ෂය සහ අනුමැතිය ලබා දුන් පුද්ගලයන් කවුරුන්ද;

(iv) ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇති මුදල, ආයෝජන ක්ෂේත්‍ර සහ අරමුදල් සපයාගත් ආකාරය කවරේද;

(v) ආයෝජනය කිරීමේදී වෙළඳපොළ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතියේ අරමුදල් වැය කිරීම සම්බන්ධයෙන් විගණනයක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) ප්‍රසම්පාදන සහ මූල්‍ය මාර්ගෝපදේශ අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, එම ක්ෂේත්‍ර කවරේද;

(v) කොන්ත්‍රාත්කරුවන්ට සිදු කළ ගෙවීම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ පිරිවැය සහ සමාගමේ වත්කම් සංසන්දනය කිරීමේදී මූල්‍ය අලාභයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, එය කොපමණද;

(iii) එය සමාගමට දැරිය හැකි මට්ටමක තිබේද;

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියෙකු පත් කර තිබේද;

(v) ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(vi) එහි අරමුණු ඉටුවී තිබේද;

(vii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2054/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය කොපමණද;

(ii) එම නිෂ්පාදනය සඳහා දායක වන වැව් සහ ජලාශ කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අභිජනන මධ්‍යස්ථාන ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, එම මධ්‍යස්ථාන කවරේද;

(v) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අළුගල්ගේ ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරමින් පවතින 'මුතුකණ්ඩිය මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ' ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(vi) එය ඉදිකිරීමෙන් පසු මොනරාගල දිස්ත්‍රික්කය තුළ මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තිය සඳහා පවතින අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඟිණියාගල පිහිටි සේනානායක සමුද්‍රයේ පවතින ධීවර තොටුපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජලාශයේ බදුලුවෙල ප්‍රදේශය ආශ්‍රිතව ධීවර තොටුපොළක් ආරම්භ කිරීම සඳහා අයදුම්පත් ලැබී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2102/2026

ගරු සුජීව දිසානායක මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත හඳුන්වාදුන් වර්ෂය කවරේද;

(ii) එම ආඥාපනත මේ වනවිටත් ක්‍රියාත්මක වන්නේද;

(iii) ආඥාපනත හඳුන්වාදීමේ ප්‍රධාන අරමුණ කවරේද;

(iv) ආඥාපනතට යටත්ව ශ්‍රී ලංකාව තුළ පවතින ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආගමික ආයතන සතුව ඇති ඉඩම්වලින් බදු අය කිරීමට අවසර ලබාදී ඇති පනත කවරේද;

(ii) එම පනත හරහා බදු අය කළ හැකි සීමාව ප්‍රතිශතයක් ලෙස පැහැදිලිව දක්වා තිබේද;

(iii) යම් ආගමික ආයතනයක් සතුව ඇති ඉඩමක් බදු දිය හැකි උපරිම කාලසීමාව කොපමණද;

(iv) එවැනි එකඟතාවක් උල්ලංඝනය වුවහොත් අසාධාරණයට ලක්වන පාර්ශ්වයකට යුක්තිය ඉටු කර ගත හැකි ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2110/2026

ගරු කංචන වැලිපිටිය මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්වැටි නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමට අදාළව විශාල බදු මුදලක් වාර්ෂිකව රජය විසින් අය කර ගන්නා බව දන්නේද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ 03 තුළ දුම්වැටි සඳහා පනවා ඇති බදු මඟින් අය කරගත් මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීත්‍යානුකූල දුම්වැටි නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමට බදු අය කළද දුම්වැටි නීතිවිරෝධීව ආනයනය කර අලෙවි කරන බව දන්නේද;

(iv) එසේ නම්, දුම්වැටි නීතිවිරෝධීව ආනයනය කිරීම සහ අලෙවි කිරීම පාලනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) නීතිවිරෝධීව දුම්වැටි වෙළෙඳාමේ නිරත පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/2026

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.03.28 දිනැති අංක 2378 දරන ගැසට් පත්‍රය අනුව 'උප පොලිස් පරීක්ෂක' තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත්;

(ii) එම අයදුම්පත් අතරින් පරීක්ෂණය සඳහා සියදෙනෙකු තේරී පත්වූ බවත්;

(iii) එච්.ජී. කවීෂ ගීතාංජන අමරසිංහ යන අයට එලෙස තේරී පත්වූවන් අතර සිටින බව හා පුහුණුව සඳහා පැමිණීමේදී රැගෙන ආ යුතු ද්‍රව්‍ය පිළිබඳව ලිඛිතව දැනුම්දී ඇති බවත්;

(iv) 2026.04.18 දින අනෙකුත් තේරී පත්වූ අය කළුතර පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයට කැඳවා තිබුණද ඔහුට එවැනි කැඳවීමක් සිදු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iv) සඳහා හේතු කවරේද;

(ii) ඔහුට සිදුව ඇතැයි කියන අසාධාරණය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල පවතින පාඨමාලා කවරේද;

(iii) එම පාඨමාලා සඳහා පසුගිය වර්ෂය තුළ බඳවාගෙන ඇති ආබාධ සහිත අභ්‍යාසලාභීන් සංඛ්‍යාව ආබාධ වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම පාඨමාලා හැදෑරීම සඳහා ආබාධ සහිත අභ්‍යාසලාභීන්ට භෞතික ප්‍රවේශය සහ සන්නිවේදන පහසුකම් සලසා තිබේද;

(v) අභ්‍යාසලාභීන් බඳවාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, ආබාධිත තත්ත්වය හෝ අන්තර්කරණ බාධා හේතුවෙන් සපුරාලීමට නොහැකි අභ්‍යාසලාභීන්ට පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා විශේෂ අවස්ථා සලසා තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුකරුවන් සඳහා ආබාධ සහිත ප්‍රජාව සමඟ කටයුතු කිරීමට අවශ්‍ය විශේෂ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද;

(ii) අභ්‍යාසලාභීන්ට සමීපතම වෘත්තීය පුහුණු ආයතනයේ අභිමත පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය අන්තර්කරණීය හා ආබාධිත හිතකාමී ආයතනික රාමුවක් ගොඩනැගීමට අවධානය යොමුවී තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා වෙන්කර ඇති ප්‍රතිපාදන කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2124/2026

ගරු සුරංග රත්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් සංඛ්‍යාව;

(ii) මේ වනවිට එම වසම්වල සේවයේ නියුතු නිලධාරින් සංඛ්‍යාව;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් සංඛ්‍යාව;

(iv) එම දිස්ත්‍රික්කයේ මේ වනවිට සේවයේ නියුතු නිලධාරින් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම තනතුර අහෝසි කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අගෝස්තු 05 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

660/2025

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ දේශීය කිරි අවශ්‍යතාවය, ආනයනය කර ඇති කිරි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) දියර කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

985/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පුහුණු කිරීම මගින් උපයා ඇති ආදායම කොපමණද;

(ii) එම ආදායම උපයන මාර්ග කවරේද;

(iii) එම කාල සීමාව තුළ කාර්යාංශයේ පුහුණුව ලබා විදේශගතවූ හා එම පුහුණුව නොලබා විදේශ ගතවූ ශ්‍රමික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළමු වතාවට විදේශගත වන සෑම ශ්‍රමිකයෙකුටම කාර්යාංශය මගින් පුහුණුවක් ලබා දීම අනිවාර්ය කිරීම වැදගත් බැවින්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1634/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිවිධ හමුදාව තුළ ස්ථිර සහ තාවකාලික සේවයේ යෙදී සිටින හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වර්ෂ 05 තුළ ඔවුන්ට නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වීම සඳහා පොදු සමා කාලයක් ලබා දුන් වාර ගණන කොපමණද;

(iii) එම පොදු සමා කාල තුළ නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වූ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2107/2026

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩවලව ජාතික වනෝද්‍යානය සහ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය අතර පිහිටි අලි කොරිඩෝව ගැසට් කරන ලද දිනය කවරේද;

(ii) කොරිඩෝව දෙපස ආරක්ෂිත විදුලි වැට ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(iii) මෙම විදුලි වැට ඉදිකිරීමේ මූලික අරමුණ කවරේද;

(iv) අලි වැට ඉදිකිරීම සඳහා දරා ඇති මුළු පිරිවැය කොපමණද;

(v) 2018 වර්ෂයේදී අලිවැට තිබියදීත් උදෑසන කාලයේ ගම්වැදුණු අලියෙකු විසින් පාසල් දරුවෙකු මරණයට පත් කළ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි කොරිඩෝව දෙපස ස්ථාපනය කර ඇති විදුලි වැටෙහි බලහරුව ගම්මානය ආවරණය වන කොටසෙහි ප්‍රධාන විදුලි වැට මේ වනවිට අක්‍රියව පවතින බව දන්නේද;

(ii) එම විදුලි වැට ඉවත් කිරීම සඳහා තීරණයක් ගෙන තිබේද;

(iii) එසේ නම්, එම තීරණය ගත් දිනය සහ අරමුණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2135/2026

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම, මිල්ලනිය සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වලින් මේ වනවිට ප්‍රදානය කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනයක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනවසරයෙන් අත්පත් කරගෙන හෝ භාවිතා කරනු ලබන කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ —

(i) බදු පදනම මත ලබාදී ඇති කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වාර්ෂිකව අය කරනු ලබන බදු මුදල;

(ii) බදු ගිවිසුම් පවතින නමුත් බදු මුදල් අයකර නොගන්නා ඉඩම් ප්‍රමාණය;

(iii) බදු ලබාදීම සඳහා පවතින නිරවුල් ඉඩම් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 අගෝස්තු 06 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

368/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ‘අපි වෙනුවෙන් අපි’ අරමුදල ආරම්භ කළ දිනය කවරේද;

(ii) අරමුදල සතු මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම අරමුදල මඟින් මුදල් වැය කළ එක් එක් කාර්යය, අදාළ ප්‍රතිලාභියා සහ වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) අරමුදල වඩාත් ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

463/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 සිට 2024.12.31 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පිරිපහදු නොකළ පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් පිරිපහදු කර අලෙවි කර ඇති ප්‍රමාණය සඳහා 18% වැට් බද්ද සහ 2.5%ක සමාජ ආරක්ෂණ බද්ද ආනයනය කළ ආයතන විසින් ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවා ඇති මුළු බදු මුදල කොපමණද;

(iv) ගෙවීමට ඇති හිඟ බදු මුදල කොපමණද;

(v) එම හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම ආයතන සඳහා බදු සහන ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

471/2025

ගරු රවී කරුණානායක මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) හි මුළු ආදායම එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් හි මුළු ලාභය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ඉහත (i) සහ (ii) ට අදාළව මුළු ඍජු සහ වක්‍ර බදු වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් සේවයේ යොදවා ඇති මුළු කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව සහ පසුගිය වර්ෂ 05 සඳහා වැටුප් සහ වේතන සඳහා දරන ලද මුළු වාර්ෂික පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශේෂ පත්‍රයේ පිළිබිඹු වන ශ්‍රී ලංකා ටෙලිකොම් හි මුළු වත්කම් වටිනාකම සහ අනුරූප වෙළඳපොල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකා ටෙලිකොම් හි ප්‍රධාන කොටස් හිමියන් තිදෙනා කවුරුන්ද;

(vii) රජය සතු කොටස්වල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

599/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සාමාන්‍ය වෛද්‍යවරයෙකුට සහ විශේෂඥ වෛද්‍යවරයෙකුට රජය විසින් ගෙවනු ලබන මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ සේවයේ නියුතුව සිටියදී නිවාඩු ලබා හෝ සේවයෙන් ඉවත්වී මේ වන විට විදේශගතව සිටින සාමාන්‍ය වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2020 සිට 2025 දක්වා වාර්ෂිකව විදේශගතවූ මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එලෙස විදේශගත වීමට බලපා ඇති හේතු කවරේද;

(v) මේ වනවිට විදේශගත වීම සඳහා ඉල්ලුම් කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) වෛද්‍යවරුන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා රජය විසින් පියවර ගෙන තිබේද;

(vii) වෛද්‍යවරුන් රට හැර යෑම අවම කිරීම සඳහා වත්මන් රජය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

705/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (United Petroleum Lanka) සමාගම සිය මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම සමාගම ශ්‍රී ලංකාවේ කරන මුළු ආයෝජනයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත සමාගම සමඟ එළැඹ ඇති ගිවිසුම්වල සඳහන් කොන්දේසි කවරේද;

(iv) මෙහෙයුම් කටයුතු සඳහා එම සමාගමට ලබා දුන් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත සමාගම ශ්‍රී ලංකාවේ සිය මෙහෙයුම් කටයුතු නැවැත්වීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

886/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තුව, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1037/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළු ගඟ-මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වූ ජනතාව පදිංචි කර ඇති ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ ජීවත්වන ජනතාවට ප්‍රමාණවත් ජල පහසුකම් නොමැතිව පීඩා විඳින බව දන්නේද;

(ii) එසේ නම්, එම ජනතාව මුහුණදී ඇති ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1761/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලසීමාව තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු සහ මැදි ආදායම්ලාභීන් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද නිවාස ණය සහ නිවාස ආධාර ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා එක් එක් වර්ෂය තුළ වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහතින් සඳහන් කළ ව්‍යාපෘති යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ව්‍යාපෘති යටතේ 2019 වර්ෂය අවසන් වනවිට ඉදිකිරීම් අවසන්ව තිබූ නිවාස සහ ඉදිකිරීම් අවසන් කර නොතිබූ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2137/2026

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, 2000 වර්ෂයේ සිට මේ දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබාදුන් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉඩම් ප්‍රදානය කිරීමේදී අනුගමනය කර ඇති කොන්දේසි කවරේද;

(iv) එම කොන්දේසි උල්ලංඝනය කළ ඉඩම්ලාභීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2138/2026

ගරු දිනේෂ් හේමන්ත මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ලොකු ලූනු පරිභෝජනය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) එම පරිභෝජනයෙන් කොපමණ ප්‍රමාණයක් දේශීය ලොකු ලූනු නිෂ්පාදනය මඟින් සපුරාලනු ලබන්නේද;

(iii) ඉතිරි අවශ්‍යතාව සපුරාලීම සඳහා වාර්ෂිකව ආනයනය කරනු ලබන ලොකු ලූනු ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(iv) දේශීය ලොකු ලූනු අස්වනු නෙළන කාලසීමාව තුළ දේශීය ලොකු ලූනු ගොවීන්ගේ ආදායම සහ වෙළඳපොළ ආරක්ෂා කිරීම සඳහා, ආනයනික ලොකු ලූනු කිලෝවක් මත අය කරනු ලබන බදු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ මැදිහත්වීම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අගෝස්තු 07 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

784/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීට වර්ෂ කිහිපයකට පෙර මාර්ග අංක 193 පුරහල සිට කඩවත දක්වා බස් රථ සේවාවක් ක්‍රියාත්මකවූ බවත්;

(ii) මේ වනවිට එම බස් රථ සේවාව ක්‍රියාත්මක නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මට්ටක්කුලිය ඩිපෝවේ සහ කඩවත ඩිපෝවේ ලංගම බස්රථ එක බැගින් යොදවා එම බස් රථ සේවාව නැවත ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

909/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට මේ වනවිට ගෙවිය යුතු මුදල කොපමණද;

(ii) එක් බලපත්‍රයක් සකස් කිරීමට වැය වන මුදල කොපමණද;

(iii) පැරණි විදේශ ගමන් බලපත්‍රයේ සහ නව විදේශ ගමන් බලපත්‍රයේ තිබෙන පිටු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පිටු සංඛ්‍යාව වෙනස් කිරීමට හේතු කවරේද;

(v) නව විදේශ ගමන් බලපත්‍රයේ ආරක්ෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් ගැටලු පවතින බව දන්නේද;

(vi) නව බලපත්‍රයේ බොහෝ වැරදි තිබෙන බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒවා නිවැරදි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) E-Passport මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීමෙන් අනතුරුව තෝරා ගන්නා ලද ආයතනයට සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීමට ලබාදී ඇති බව දන්නේද;

(ii) ඉහත ආයතනයෙන් මිල ගණන් නොකැඳවා සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීමට ලබා දීම, පිළිගත් ක්‍රමවේදයට පටහැනි නොවන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

946/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගමට 2015 වර්ෂයේ සිට මේ දක්වා ලැබුණු විදේශ රැකියා ඇබෑර්තු සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා ඇබෑර්තු සඳහා උපරිම පිරිසක් යැවීමට නොහැකිවූ හේතු කවරේද;

(iii) රැකියා ඇබෑර්තුවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1066/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ පොල් වගාවට බලපාන සුදු මැස්සන් පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) බලපෑමට ලක්වූ පොල් වගාකරුවන් සඳහා වන්දි/මූල්‍ය ආධාර ලබා දීමට සැලසුම් කර තිබේද;

(iii) සුදු මැස්සාගේ පැතිරීමට හේතු වන දේශගුණික තත්ත්වයන් සම්බන්ධයෙන් පාරිසරික ඇගයීම් සිදු කර තිබේද;

(iv) ජෛව පාලකයක් ලෙස එන්කාර්සියා ග්වාඩලූප් (*Encarsia guadeloupe)* නැමැති කෘමියා ලැබී ඇති කලාප සංඛ්‍යාව කොපමණද;

(v) එම මැදිහත්වීමෙහි ඵලදායිතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුදු මැස්සා අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තිබේද;

(ii) ජීව විද්‍යාත්මක පාලන ක්‍රම සහ විකල්ප පිළියම් පිළිබඳ ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබේද;

(iii) පොල් වගාවේ පළිබෝධ පාලනය සඳහා අවශ්‍ය කරන හදිසි අරමුදල් මීළඟ අයවැයෙන් වෙන් කරන්නේද;

(iv) නව පළිබෝධ පාලන ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබේද;

(v) කෘෂිකාර්මික ව්‍යසනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සහ එයට විසඳුම් සෙවීම සඳහා අන්තර්-අමාත්‍යාංශ සම්බන්ධීකරණයක් ඇති කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1363/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) යම් පාසලක අවුරුදු 08කට වැඩි කාලයක් සේවය කරමින් සිටින විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුහල්පතිවරයෙක් එකම පාසලක අවුරුදු 08කට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යෙදීම හේතුවෙන් උද්ගතවී ඇති ගැටලු කවරේද;

(iii) 2012 වර්ෂයේදී අධි සේවක පදනම මත, විදුහල්පතිවරුන් ලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති තැනැත්තන් හට උසස්වීම් ලබාදී ඇතත්, ඔවුන්ගේ සේවයට අදාළ පරිපාලන දීමනා ලබාදී නොමැති බව දන්නේද;

(iv) ඒ සඳහා ඇති බාධා කවරේද;

(v) පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සඳහා, අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට අයදුම් කිරීමට පවතින බාධා කවරේද;

(vi) අවුරුදු 08කට වැඩි කාලයක් එකම පාසලක අධි සේවක පදනම මත සේවය කරන විදුහල්පතිවරුන්ට, ස්ථාන මාරු ලබා දීමේ හැකියාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1364/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 30ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 18,000ක් පමණ සේවයේ නිරතව සිටින බවත්, මේ දක්වා ඔවුන්ට කිසිදු උසස්වීමක් ලබාදී නොමැති බවත් දන්නේද;

(ii) එම සේවයේ උසස්වීම් ලබාදීම ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන්නේද;

(iii) එම සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1378/2025

ගරු නීතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති සහ එම සමිතිවලට අයත් ග්‍රාමීය බැංකු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා අතරින් විවිධ මූල්‍ය වංචා හා දූෂණ චෝදනා එල්ලවී ඇති සමිති, ග්‍රාමීය බැංකු සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iii) එම වංචා හා දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් කමිටුවක් පත් කර තිබේද;

(iv) එසේ නම්, එම කමිටු සාමාජිකයන්ගේ නම් කවරේද;

(v) එම වංචා හා දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් කමිටුව ලබා දුන් නිර්දේශ සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1659/2025

ගරු චානක මාදුගොඩ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවසන් වරට පැවති සීමිත සහ විවෘත තරඟ විභාගය මඟින් කළමනාකරණ සේවා නිලධාරි තනතුර සඳහා බඳවාගෙන ඇති මුළු නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබා ඇති සහ මේ වනවිට වැඩ භාරගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බඳවාගැනීම්වලින් පසුව මේ වනවිට එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සඳහා පැවති තරඟ විභාගයේ කඩයිම් ලකුණු ආසන්නයට ලකුණු ලබා සිටින අපේක්ෂකයන් බඳවාගැනීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1826/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වන්නි මැතිවරණ කොට්ඨාසයට අයත් —

(i) කුඩා සහ විශාල වාරි වැව් සංඛ්‍යාව;

(ii) වාරි කටයුතු සඳහා භාවිතා කරනු ලබන වැව් සංඛ්‍යාව;

(iii) වාරි කටයුතු සඳහා භාවිතා නොකරන වැව් සංඛ්‍යාව;

(iv) කුඹුරු ඉඩම් ප්‍රමාණය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) (අ)(iii)හි සඳහන් වැව්, වාරි කටයුතු සඳහා භාවිතා නොකිරීමට හේතු කවරේද;

(ii) එම වැව් ප්‍රතිසංස්කරණය කර එම වැව්වලට පහළින් පිහිටි ඉඩම්, වගා කිරීම සඳහා ඉඩම් නොමැති පවුල් සඳහා ලබාදීමේ හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1829/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් තමන්ගේ වියදමෙන් වාර්තා කරන පුවත් සඳහා මාධ්‍ය ආයතන ගෙවනු ලබන මුදල පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ගෙවීම් ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iii) ඔවුන්ට නිශ්චිත අවම දීමනාවක් හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

(iv) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් එවනු ලබන ගවේෂණාත්මක පුවත් විවිධ හේතු මත මාධ්‍ය ආයතන විසින් වාරණය කිරීමට හෝ විකෘති කිරීම වැළැක්වීමට ඇති වැඩපිළිවෙළ කවරේද;

(v) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මාධ්‍ය ආයතන වෙත යොමු කරන ගවේෂණාත්මක පුවත් සඳහා මාධ්‍ය ආයතන පමණක් සම්මාන දිනා ගැනීම නතර කිරීමට මැදිහත් වන්නේද;

(vi) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සපයන තොරතුරු සහ දර්ශන හේතුවෙන් ඔවුන් දෝෂාරෝපණයට ලක්වීම හෝ අනාරක්ෂිතවීම වැළැක්වීමට ගන්නා පියවර කවරේද;

(vii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මුහුණ දෙන අසාධාරණයන් සම්බන්ධයෙන් සොයා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?